**කොටපොල ප්‍රාදේශීය සභාව - 2021**
**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

**කොටපොල** ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කොටපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි වැඩි දියුණු කිරීමට අදාලව රු.6,580,315 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි | ප්‍රාදේශිය සභා කාර්යාලයේ ඉහළ මහල ඉදිකිරීමේ I හා II අදියර සඳහා ගෙවීම් සිදු කර ඇත්තේ 2022 වර්ෂයේ බැවින් එය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ප්‍රාග්ධනිත කරන බවත්, කොස්මෝදර ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල සම්පූර්ණයෙන්ම ගෙවීම් සිදුකර නොමැති බවත්, වැඩ අවසන් වී ගෙවීම් සිදුකිරීමෙන් පසු 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ප්‍රාග්ධනිත කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදල වෙනුවෙන් ගෙවිය යුතු රු.4,492,028 ක් සඳහා විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | | |
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම් රු.156,678 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | | |
| (ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.211,496 ක් වටිනා ඉන්වෙන්ට්‍රි හා පරිභෝජන ස්වරූපයේ උපකරණ තොග යන්ත්‍රෝපකරණ, ලී බඩු හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුළ ජ'නල් සටහන් අංක 43 යටතේ ඉකුත් වර්ෂවල ගිණුම්ගත නොකළ ණයහිමි ශේෂ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමේදී කර්මාන්ත ණයහිමි ශේෂ 15 කට අදාලව රු.4,703,281 ක් විවිධ ණයහිමි ගිණුමට බැර කර තිබුණි. | 2022 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 06 කට අදාලව ණයහිමි ප්‍රතිපාදන රු.16,962,774 ක් අඩුවෙන් සලසා තිබුණි. | | |
| (උ) සමාලෝචිත වර්ෂයේ විමධ්‍යගත සංවර්ධන වැඩසටහන හා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 09 කට අදාලව රු.2,229,469ක ණයගැති ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | | |
| (ඌ) සමාලෝචිත වර්ෂය තුළ පොදු අරමුදල් ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 07 කට අදාලව අත රැඳවුම් මුදල් රු.365,934ක් තැන්පතු ගිණුමේ හා කර්මාන්ත ණයහිමියන් යටතේද ගිණුම්ගත කර තිබුණි. | | |
| (එ) ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 07 කට අදාලව ලැබිය යුතු රු.1,201,295 ක වටිනාකම ප්‍රාග්ධන ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | | |

| | | |
|---|---|---|
| (ඒ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 04 කට අදාලව එකතුව රු. 7,116,821ක් කර්මාන්ත ණයගැති ගිණුමට අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට ගිවිසුම්ගත වී තිබූ කර්මාන්ත 03 කට අදාලව රු.1,158,129 ක් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | | |
| (ඕ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ශේෂ පිරික්සුමේ සියලුම ආදායම් හා වියදම් ඇතුළත් කර නොතිබුණි. | | |

**1.6.2 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට ඉදිරියට පැවත එන රු.64,848 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම හටගැනීමට හේතු සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.4,599,517 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.19,351,684 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**වරිපනම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක 701 ක් පැවති අතර එයින් වරිපනම් ඒකක 36 කට අදාලව රු.165,984 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් කඩිනමින් අය කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදල් ප්‍රතිපාදන මත කොන්ක්‍රීට් කාණු ඉදි කිරීමේදී පදම් කළ ලෑලි (Plywood) පුවරු භාවිතා කර හැඩයම් සැකසීම වෙනුවෙන් Ct-36 යටතේ හඳුන්වා දුන් රු.843 ක රේටය වෙනුවට පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දුන් ST-057 හා ST-064 රේටයන් භාවිතා කිරීම නිසා කාණු 05ක් ඉදි කිරීමේදී හැඩයම් සැකසීම වෙනුවෙන් වර්ගමීටර් 484.3 කට රු.165,742ක් වැඩිපුර ගෙවා තිබුණි. | ප්‍රධාන ලේකම් මඟින් නිකුත් කර ඇති 03/2014 හා 2014 ඔක්තෝබර් 15 දිනැති මුදල් චක්‍රලේඛය මඟින් මාර්ග වැඩ සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී අනුමත කරන ලද ඒකක මිල ගණන් භාවිතා කළ යුතු බව . | සුදුසු හා වාසිදායක රේටයන් භාවිතා කළ යුතුය. |